# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,480—1958 අගෝස්තු 23 වැනි සෙනසුරාදා—23.8.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

ජී.ජී.ඕ. අංකය ඇල්. 91

ඇම්/ඇල් සහ ඇල්. ඩී. අංකය ජේ 258 (බීආර්)

1950 අංක 9 දරණ රජයට ඉඩම් ලබාගැනීමේ ආඥා පනතේ 17 වැනි වගන්තියේ ඇති විධිවිධාන යටතේ, ආග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, ඇපැල් නඩු ඇසීම සම්බන්ධව ඇති විනිශ්චය මණ්ඩලයේ සමාජිකයෙකු ලෙසත්, සභාපති ලෙසත්, රාජනීතිඥ ඇන්. කේ. චොක්සි මහතා, 1958වේ සැප්තැම්බර මස 1 වැනි දින සිට පත්කරනු ලැබ සිටී.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 වේ අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

# මිල පාලන දැන්වීම්

**ආර්/10/1958 වෙනි අංක දරණ ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950හේ අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් මලගොඩ ගමගේ දයානන්ද අමරසිංහ වන මම, 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව —

(1) පහත සඳහන් ආහාර මිළ නියෝග අද දින සිට මෙයින් අවලංගු කරමි :—

(අ) 1958 ජූනි මස 9 වෙනි දිනය හා 11,352 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ විශෙෂ ගැසට් පත්‍රයේ පලකරනලද 1958 ජූනි මස 4 වෙනි දිනය හා ආර්/7/1958 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය ;

(ආ) 1958 ජූලි මස 15 වෙනි දිනය හා 11,425 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ විශෙෂ ගැසට් පත්‍රයේ පලකරනලද 1958 ජූලි මස 12 වෙනි දිනය හා ආර්/9/1958 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් එක් එක් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයකද්, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයෙහි පළමු වැනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, එහි 3 වෙනි හා 4 වෙනි තීරවල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා—

(අ) උපලේඛනයෙහි 2 වෙනි තීරයෙහි සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් ද්‍රව්‍ය වරකට දළබර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයෙහි 2 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, මේ උප ලේඛනයෙහි 2 වෙනි තීරයෙහි සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද නියෝග කරමි.

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමීත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එකී ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවද නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයන් ඇතුලත මේ උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දින;

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළඳාමේ ස්වාභය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) මේ උපලේඛනයේ 2 වෙනි තීරයෙහි සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලබන ද්‍රව්‍යය යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් නැත හොත් බහාලනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුලත් වන බවද නියම කරමි.

1958 අගෝස්තු මස 19 වෙනි දින පෙරවරු 9 ට රත්නපුර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇම්. ඩී. අමරසිංහ,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ
පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| ප්‍රදේශය | විස්තර | තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| (1) (අ) රත්නපුර පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරලේ පල්ලේ පත්තුව, (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදෑනි වසම් හැර කුරුවිටි කෝරලේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදෑනි වසම් | ඇනු (රතු ඇනු හැර වෙනත් සියලුම වර්ග වල ඇනු) ... ... | 21 0 | ... 0 24 |
| | අර්තාපල් ... ... | 30 0 | ... 0 33 |
| | මසූර් පරිප්පු ... ... | 61 0 | ... 0 62 |
| | මුං ඇට ... ... | 46 0 | ... 0 47 |
| | උම්බලකඩ ... ... | 247 0 | ... 2 52 |
| | උළුඳු (පියලි නොකළ) ... | 47 76 | ... 0 49 |
| | රතුළුනු ... ... | 26 0 | ... 0 30 |
| | අබ ... ... | 71 0 | ... 0 72 |
| | ලූනු ... ... | — | ... 0 6 |
| | කොත්තමල්ලි ... ... | 41 0 | ... 0 42 |
| | සුදු දුරු ... ... | 119 0 | ... 1 22 |
| | වියලි මිරිස් ... ... | 76 0 | ... 0 77 |
| | කඩල පරිප්පු ... ... | 40 79 | ... 0 42 |
| (2) කලටුවාව නැගෙනහිර ගම්මුලාදෑනි වසම හැර කුරුවිටි කෝරලේ පල්ලේ පත්තුව සහ කරඳන ගම්මුලාදෑනි වසම හැර කුරුවිටි කෝරලේ මැද පත්තුව | ඇනු (රතු ඇනු හැර වෙනත් සියලුම වර්ගවල ඇනු) ... ... | 20 75 | ... 0 23 |
| | අර්තාපල් ... ... | 29 75 | ... 0 32 |
| | මසූර් පරිප්පු ... ... | 60 75 | ... 0 61 |
| | මුං ඇට ... ... | 45 75 | ... 0 46 |
| | උම්බලකඩ ... ... | 246 75 | ... 2 51 |
| | උළුඳු (පියලි නොකළ) ... | 47 51 | ... 0 48 |
| | රතුළුනු ... .. | 25 75 | ... 0 29 |
| | අබ ... ... | 70 75 | ... 0 71 |
| | ලූණු ... ... | — | ... 0 6 |
| | කොත්තමල්ලි ... ... | 40 75 | ... 0 41 |
| | සුදු දුරු ... ... | 118 75 | ... 1 21 |
| | වියලි මිරිස් ... ... | 75 75 | ... 0 76 |
| | කඩල පරිප්පු ... ... | 40 54 | ... 0 41 |

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| ප්‍රදේශය | විස්තර | තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. |
| (3) (අ) නවදුන් කෝරලේ උඩ පත්තුව, මැද පත්තුව සහ පල්ලේ පත්තුව, (ආ) කුකුළු කෝරලේ මැද පත්තුව | ඇනු (රතු ඇනු හැර වෙනත් සියලුම වර්ගවල ඇනු) ... ... | 21 15 ... | 0 25 |
| | අර්තාපල් ... ... | 30 15 ... | 0 34 |
| | මසූර් පරිප්පු ... ... | 61 15 ... | 0 63 |
| | මුංඇට ... ... | 46 15 ... | 0 48 |
| | උම්බලකඩ ... ... | 247 15 ... | 2 53 |
| | උලුඳු (පියලි නොකළ) ... | 47 91 ... | 0 50 |
| | රතුඇනු ... ... | 26 15 ... | 0 31 |
| | අබ ... ... | 71 15 ... | 0 73 |
| | ලුණු ... ... | — ... | 0 06 |
| | කොත්තමල්ලි ... ... | 41 15 ... | 0 43 |
| | සුදු ළූණු ... ... | 119 15 ... | 1 23 |
| | වියලි මිරිස් ... ... | 76 15 ... | 0 78 |
| | කඩල පරිප්පු ... ... | 40 94 ... | 0 48 |
| (4) (අ) බලන්ගොඩ පලාත් ආණ්ඩු සභා ප්‍රදේශය, (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය, (ඇ) කුරුවිටි කෝරලේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ, සහ කුඩාව යන ගම්මුලාදෑනි වසම්, (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරලේ හෙල පල්ලේ පලාත, හෙලඋඩ පලාත සහ උඩු වග්ගම පත්තුව, (ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදෑනි වසම, (ඊ) කුකුළු කෝරලේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදෑනි වසම | ඇනු (රතු ඇනු හැර වෙනත් සියලුම වර්ගවල ඇනු) ... ... | 21 25 ... | 0 26 |
| | අර්තාපල් ... ... | 30 25 ... | 0 35 |
| | මසූර් පරිප්පු ... ... | 61 25 ... | 0 64 |
| | මුං ඇට ... ... | 46 25 ... | 0 49 |
| | උම්බලකඩ ... ... | 247 25 ... | 2 54 |
| | උලුඳු (පියලි නොකළ) ... | 48 01 ... | 0 51 |
| | රතු ඇනු ... ... | 26 25 ... | 0 32 |
| | අබ ... ... | 71 25 ... | 0 74 |
| | ලුණු ... ... | — ... | 0 06 |
| | කොත්තමල්ලි ... ... | 41 25 ... | 0 44 |
| | සුදු ළූණු ... ... | 119 25 ... | 1 24 |
| | වියලි මිරිස් ... ... | 76 25 ... | 0 79 |
| | කඩල පරිප්පු ... ... | 41 04 ... | 0 44 |
| (5) (අ) කොළොන්නා කෝරලේ කොළොන්නා ගම් පත්තුව සහ දියපොවගම් පත්තුව, (ආ) කඩවත කෝරළේ තල්පිටිගම් පත්තුව, (ඇ) අටකලං කෝරලේ පල්ලේ බැද්ද ගම්මුලාදෑනි වසම හැර දෙපත්තුව, (ඈ) මැද කෝරළේ කල්තොට වසම | ඇනු (රතු ඇනු හැර වෙනත් සියලුම වර්ගවල ඇනු) ... ... | 21 50 ... | 0 27 |
| | අර්තාපල් ... ... | 30 50 ... | 0 36 |
| | මසූර් පරිප්පු ... ... | 61 50 ... | 0 65 |
| | මුං ඇට ... ... | 46 50 ... | 0 50 |
| | උම්බලකඩ ... ... | 247 50 ... | 2 55 |
| | උළුඳු (පියලි නොකළ) ... | 48 26 ... | 0 52 |
| | රතු ඇනු ... ... | 26 50 ... | 0 83 |
| | අබ ... ... | 71 50 ... | 0 75 |
| | ලුණු ... ... | — ... | 0 06 |
| | කොත්තමල්ලි ... ... | 41 50 ... | 0 45 |
| | සුදු ළූණු ... ... | 119 50 ... | 1 25 |
| | වියලි මිරිස් ... ... | 76 50 ... | 0 80 |
| | කඩල පරිප්පු ... ... | 41 29 ... | 0 45 |

සැළකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමෙ නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මෙ මිළ වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

අතිරේක ආහාර ද්‍රව්‍ය.

කේ.ඇල්. 47 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

## 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් විල්ප්‍රඩ් ප්‍රැන්සිස් ප්‍රදිනාන්දු වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(i) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍ය, තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිල මේ උප ලේඛනයේ 2 වැනි හා 3 වැනි තීර වල අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(ii) තවද, මෙම නියෝගයේ කාර්‍යය සඳහා—

(අ) උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) එසේම කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුලත මේ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිනිය යුතු බව නියෝග කරමි.

(iv) එසේම කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුලත යම් ස්ථානයක හෝ යම් වාහනයක උප ලේඛනයෙහි 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එකී ද්‍රව්‍යය සම්බන්ධයෙන්, මෙම නියෝගයෙන් නියමිත වැඩි ම මිල ගණන් සටහන් කරන ලද දැන්වීමක්, එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(v) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(vi) කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුලත මේ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකු හා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම වෙලෙන්දෙකු විසින්, මිලයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

(vii) උප ලේඛනයෙහි 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණූ ලබන ද්‍රව්‍යය යම් කිසි දෙයක ඔතනු ලැබෙනම්, නැතහොත් බහා ලනු ලැබේ නම් එහි මිලත් උප ලේඛනයේ 2 සහ 3 වැනි තීරවල සඳහන් වැඩිම මිල ගණන් වලට ඇතුලත් වන බවද සඳහන් කරමි.

ඩබ්ලිව්. ඇස්. ප්‍රදීපාසු,
සහකාර මිල පාලක තැන, කළුතර දිස්ත්‍රික්කය.

1958ක්වූ අගෝස්තු මස 19 වැනි දින පූ.භා. 11.30 ට කළුතරදී අත්සන් කරන ලදී.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| විස්තරය | තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට දල බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල |
| | රු. ශ. | රු. ශ. |
| ඇණූ රතුඇණූ හැර වෙනත් සියළුම | 20 68 | 0 23 |
| කොත්තමල්ලි | 41 37 | 0 41 |
| සුදු දුරු | 122 03 | 1 24 |
| වියලි මිරිස් | 77 56 | 0 77 |
| මුං ඇට | 46 54 | 0 46 |
| උළුඳු (පියලි නොකළ) | 48 36 | 0 49 |
| කඩල පරිප්පු | 41 37 | 0 41 |
| මසූර් පරිප්පු | 62 05 | 0 62 |
| රතු ඇණූ | 25 86 | 0 29 |
| අර්තාපල් | 30 0 | 0 32 |
| උම්බලකඩ | 258 55 | 2 58 |
| අබ | 72 39 | 0 72 |
| ලුනු | — | 0 06 |

සැලකිය යුතුයි.— මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මේ මිල ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

**1958 අංක 13 දරණ ආහාර මිල නියෝගය** **අතිරේක ආහාර ද්‍රව්‍ය.**

### 1950 අංක 29 දරණ ආහාර මිල පනත

#### නියෝගය

ගාලු දිස්ත්‍රික්කයේ, සහකාර ආහාර මිළ පාලක තැන්පත් හේවා ඩනී වීරරත්න වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් සහ එම පනතේ 3 (2) වැනි වගන්තියෙන් ද මා හට පැවරී තිබෙන බලතල අනුව—

(1) පහත සඳහන් ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරනු ලැබේ :—

(අ) 1958 ජූනි මස 10 වැනි දිනය හා 11,353 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 ජූනි මස 3 වැනි දිනය හා 1958 අංක 5 දරණ

(ආ) 1958 ජූලි මස 15 වැනි දිනය හා 11,425 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 ජූලි මස 10 වැනි දිනය හා 1958 අංක 11 දරණ මිළ නියෝගය.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් සිල්ලර වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද, එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන් එම උප ලේඛනයේ 3 සහ 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් වරකට දළ බර හොන්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩුව ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙණෙන පරිදි තැබිය යුතුබව මෙයින් නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, මෙයින් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්; පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;
(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද, යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද, නියම කරමි.

(8) උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1958 අගෝස්තු මස 14 වැනි දින පස්වරු 2 ට ගාල්ලේදී අත්සන් කරන ලදී.

එච්. ඩී. වීරරත්න,
සහකාර ආහාර මිළ පාලක තැන,
ගාලු පාලන දිස්ත්‍රික්කය.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>පළාත් | 2 වැනි තීරය<br>විස්තර | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| | එළූ (රතුළූණු හැර අන් සියලුම වර්ග)— | 20 70 | 0 23 |
| | කොත්තමල්ලි | 41 40 | 0 42 |
| | සුදුරු | 122 10 | 1 25 |
| 1. ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර | වියලි මිරිස් | 77 60 | 0 78 |
| 2. අම්බලන්ගොඩ පලාත් ආණ්ඩු සභාව | මුං ඇට | 46 55 | 0 47 |
| 3. දෙඩන්දූව සුළු නගර සභා සීමාව | උලුඳු (පියලි නොකල) | 48 37 | 0 49 |
| 4. හික්කඩුව සුළු නගර සභා සීමාව | කඩල පරිප්පු | 41 15 | 0 41 |
| 5. වතුගෙදර සුළු නගර සභා සීමාව | මයිසූර් පරිප්පු | 62 06 | 0 62 |
| 6. බලපිටිය සුළු නගර සභා සීමාව | රතුළූණු | 25 85 | 0 29 |
| | අර්තාපල් | 30 0 | 0 32 |
| | උම්බලකඩ | 258 60 | 2 59 |
| | අබ | 72 40 | 0 73 |
| | ලුණු (පිසීමට, කෑමට ගන්නා වර්ගය) | — | 0 06 |
| ගම්කාර්‍ය්‍ය සභා— | | | |
| අහන්ගම | | | |
| අක්මීමන | | | |
| බද්දේගම | | | |
| බටපොල | | | |
| බෙන්තොට | එළූ (රතුළූණු හැර අන් සියලුම වර්ග) | 20 70 | 0 23 |
| බෝපෙ | කොත්තමල්ලි | 41 40 | 0 42 |
| ඇල්පිටිය | සුදුරු | 122 10 | 1 25 |
| හබරාදුව | වියලි මිරිස් | 77 60 | 0 78 |
| හික්කඩුව | මුං ඇට | 46 55 | 0 47 |
| කොස්ගොඩ | උලුඳු (පියලි නොකල) | 48 37 | 0 49 |
| කරන්දෙනිය | කඩල පරිප්පු | 41 15 | 0 41 |
| කෝදගොඩ | මයිසූර් පරිප්පු | 62 06 | 0 62 |
| කොට්ටව | රතුළූණු | 25 85 | 0 29 |
| මාදම්පෙ | අර්තාපල් | 30 0 | 0 32 |
| නාගොඩ | උම්බලකඩ | 258 60 | 2 59 |
| පෝද්දල | අබ | 72 40 | 0 73 |
| රත්ගම | ලුණු (පිසීමට, කෑමට ගන්නා) | — | 0 06 |
| තෙලිකඩ-මාඳුවාන | | | |
| වදුරඹ | | | |
| වැලිවිටිය-දිවිතුරේ | | | |
| වැයිහේන | | | |
| වේරගොඩ | | | |
| හිනිදුම සහ ඕපාත ගම්කාර්‍ය්‍ය සීමාවන් ඇතුලත | එළූ (රතුළූණු හැර අන් සියලුම වර්ග) | 21 55 | 0 24 |
| | කොත්තමල්ලි | 42 25 | 0 43 |
| | සුදුරු | 123 0 | 1 30 |
| | වියලි මිරිස් | 78 50 | 0 80 |
| | මුංඇට | 47 40 | 0 49 |
| | උලුඳු (පියලි නොකල) | 49 22 | 0 50 |
| | කඩල පරිප්පු | 42 0 | 0 43 |
| | මයිසූර් පරිප්පු | 63 50 | 0 65 |
| | රතුළූණු | 26 70 | 0 31 |
| | අර්තාපල් | 31 0 | 0 35 |
| | උම්බලකඩ | 265 80 | 2 68 |
| | අබ | 74 40 | 0 76 |
| | ලුණු (පිසීමට ගන්නා) | — | 0 07 |

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| පළාත් | විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
| නෙළුව ගම්සභා සීමාව ඇතුලත ... | ළූණු (රතුළූණු හැර) අන් සියලුම වර්ග) | 22 40 ... | 0 25 |
| | කොත්තමල්ලි ... ... | 43 25 ... | 0 45 |
| | සූදුරු ... ... | 124 0 ... | 1 35 |
| | වියලි මිරිස් ... ... | 79 50 ... | 0 85 |
| | මුංඇට ... ... | 48 40 ... | 0 51 |
| | උලුඳු (පියලි නොකල) ... | 50 22 ... | 0 55 |
| | කඩල පරිප්පු ... ... | 43 0 ... | 0 48 |
| | මයිසූර් පරිප්පු ... ... | 65 0 ... | 0 66 |
| | රතුළූණු ... ... | 27 70 ... | 0 32 |
| | අර්තාපල් ... ... | 32 0 ... | 0 36 |
| | උම්බලකඩ ... ... | 272 0 ... | 2 75 |
| | අබ ... ... | 75 10 ... | 0 80 |
| | ලුණු (පිසීමට, කෑමට ගන්නා) ... | — ... | 0 08 |

සැලකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමෙ නියමිත මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මෙ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

ඇම්. ටී./9/58 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය. අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950 අංක 29 දරන මිල පාලන පනත

### නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් හෙට්ටිගේ දොන් විලියම් බෝද්දිදස වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතේ 4 වැනි සහ 3 (2) යන කොටස් වලින් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) පහත සඳහන් ආහාර මිල නියෝග අද දින සිට මෙයින් අවලංගු කරමි :—

(අ) 1958 ජූනි 11 වැනි දිනය හා 11,354 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1958 ජූනි 6 වැනි දිනය හා ඇම්. ටී./5/58 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය ;

(ආ) 1958 ජූලි 19 වැනි දිනය හා 11,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1958 ජූලි 15 වැනි දිනය හා ඇම්. ටී/8/58 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය.

(2) මීට යාකර ඇති උපලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් එක් එක් ද්‍රව්‍යය තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද, සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද එම උප ලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දැන් පටන් විකිණිය හැකි වැඩිම මිල බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) මෙම උපලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ එම උපලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උප ලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම උප ලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල එම උප ලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් කිසිම ද්‍රව්‍යයක් තවත් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) එසේම මෙම උප ලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල යම් ස්ථානයක හෝ යම් වාහනයක මෙම උප ලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙලෙන්දෙකුම එකී ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා රාත්තල හෙවත් " රා " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) මෙහි ඇතුළත් උප ලේඛනවල 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල එම උප ලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා එම උප ලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිලයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්;—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයේ විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) මෙහි උප ලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණන ලබන ද්‍රව්‍යය යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහාලනු ලැබේ නම් එහි මිලත් මෙහි උප ලේඛනවල 2 සිට 14 දක්වා ඇති තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1958 අගෝස්තු මස 18 වැනි දින පස්වරු 12.15ට මාතර කච්චේරියේදී අත්සන් කරන ලදී.

එච්. ඩී. ඩී. බෝද්දිදස,
මාතර දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන.

## උපලේඛනය

දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිල

| 1 වැනි තීරය ප්‍රදේශය | 2 වැනි තීරය ඇණු (රතුළූණු හැර වෙනත් සියලුම) රු. ශ. | 3 වැනි තීරය කොත්තමල්ලි රු. ශ. | 4 වැනි තීරය සූදුරු රු. ශ. | 5 වැනි තීරය වියලි මිරිස් රු. ශ. | 6 වැනි තීරය මුං ඇට රු. ශත. | 7 වැනි තීරය උලුඳු (පියලි නොකල) රු. ශත. | 8 වැනි තීරය කඩල පරිප්පු රු. ශත. | 9 වැනි තීරය මසූර් පරිප්පු රු. ශත | 10 වැනි තීරය රතුළූණු රු. ශත. | 11 වැනි තීරය අර්තාපල් රු. ශත. | 12 වැනි තීරය උම්බලකඩ රු. ශත. | 13 වැනි තීරය අබ රු. ශත. | 14 වැනි තීරය ලුනු රු. ශත. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාතර නගර සහා සීමාව, දෙවිනුවර සුලු නගර සහා සීමාව, දෙවිනුවර ගම්කායයී සහා සීමාව, කැකනදුර ගම්කායයී සහා සීමාව, මඩිහ-ගොඩ ගම ගම්කායයී සහා සීමාව, මාලිම්බඩ ගම්කායයී සහා සීමාව, මොලොද්දුව ගම්කායයී සහා සීමාව, නායිමන–මාකාවිට ගම්කායයී සහා සීමාව | 22 0 ... | 42 0 ... | 121 0 ... | 77 0 | 47 50 ... | 48 76 ... | 42 29 ... | 62 50 ... | 27 0 ... | 31 0 ... | 252 0 ... | 72 0 ... | — |
| වැලිගම නගර සහා සීමාව, වැලිගම ගම්කායයී සහා සීමාව | 21 90 ... | 41 90 ... | 120 90 ... | 76 90 | 47 40 ... | 48 66 ... | 42 19 ... | 62 40 ... | 26 90 ... | 30 90 ... | 251 90 ... | 71 90 ... | — |
| අකුරැස්ස ගම්කායයී සහා සීමාව ...<br>ගොඩපිටිය ගම්කායයී සහා සීමාව ...<br>කඹුරුපිටිය ගම්කායයී සහා සීමාව ... | 22 25 ... | 42 25 ... | 121 25 ... | 77 25 | 47 75 ... | 49 01 ... | 42 54 ... | 62 75 ... | 27 25 ... | 31 25 ... | 252 25 ... | 72 25 ... | — |
| හක්මන ගම්කායයී සහා සීමාව ...<br>කන්දපිටවලකඩ ගම්කායයී සහා සීමාව ...<br>දික්වැල්ල ගම්කායයී සහා සීමාව ... | 22 45 ... | 42 45 ... | 121 45 ... | 77 45 | 47 95 ... | 49 21 ... | 42 74 ... | 62 95 ... | 27 45 ... | 31 45 ... | 252 45 ... | 72 45 ... | — |
| මොරවක ගම්කායයී සහා සීමාව ... | 22 50 ... | 42 50 ... | 121 50 ... | 77 50 | 48 0 ... | 49 26 ... | 42 79 ... | 63 0 ... | 27 50 ... | 31 50 ... | 252 50 ... | 72 50 ... | — |
| බෙරලපනාතර ගම්කායයී සහා සීමාව ...<br>ඇදතියාය ගම්කායයී සහා සීමාව ... | 22 75 ... | 42 75 ... | 121 75 ... | 77 75 | 48 75 ... | 50 01 ... | 43 54 ... | 63 25 ... | 27 75 ... | 31 75 ... | 252 75 ... | 72 75 ... | — |

සැලකිය යුතුයි.—මෙ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමෙ නියමිත මිල නොවෙ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මෙ මිල ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

## උපලේඛනය

### ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල

| 1 වැනි තීරය ප්‍රදේශය | 2 වැනි තීරය හාල් (රතුඑළු හැර වෙනත් සියලුම) රු. ශ. | 3 වැනි තීරය කොත්තමල්ලි රු. ශ. | 4 වැනි තීරය සූදුරු රු. ශ. | 5 වැනි තීරය වියලි මිරිස් රු. ශ. | 6 වැනි තීරය මුං ඇට රු. ශත. | 7 වැනි තීරය උලුඳු (පියලි නොකළ) රු. ශත. | 8 වැනි තීරය කඩල පරිප්පු රු. ශත. | 9 වැනි තීරය මසූර් පරිප්පු රු. ශත. | 10 වැනි තීරය රතුළුනු රු. ශත. | 11 වැනි තීරය අර්තාපල් රු. ශත. | 12 වැනි තීරය උම්බලකඩ රු. ශත. | 13 වැනි තීරය අබ රු. ශත. | 14 වැනි තීරය ලුනු රු. ශත. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාතර නගර සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| දෙව් නුවර සුලු නගර සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| දෙව්නුවර ගම්කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| කැකනදුර ගම්කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| මඩිහගොඩගම ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| මාලිම්බඩ ගම් කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| මොලොද්දුව ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| නායිමන--මාකාවිට ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| වැලිගම නගර සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| වැලිගම ගම් කායයී සභා සීමාව ... ... | 0 24 ... | 0 44 ... | 1 24 ... | 0 84 ... | 0 48 ... | 0 49 ... | 0 45 ... | 0 62 ... | 0 32 ... | 0 33 ... | 2 52 ... | 0 72 ... | 0 06 |
| අකුරැස්ස ගම් කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| ගොඩපිටිය ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| කඹුරුපිටිය ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| හක්මන ගම් කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| කන්දපිටවලකඩ ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| දික්වැල්ල ගම් කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| මොරවක ගම් කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |
| බෙරලපනාතර ගම් කායයී සභා සීමාව ... | | | | | | | | | | | | | |
| දෙනියාය ගම් කායයී සභා සීමාව ... ... | | | | | | | | | | | | | |

**සැලකිය යුතුයි.**—මෙ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමෙ නියමිත මිල නොවෙ. මෙවා ඒ ඒ ද්‍රව්‍යය විකිණිය හැකි ඉතාම වැඩි මිල ගණන්ය. මෙ මිල ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී